## තොරතුරු පත්‍රිකාව

## භූමිකා රංගනයේ යෙදෙමු.

ඉංග්‍රිසි භාෂාවෙන් "චරිතය" යන්න හැඳින්වීමට භාවිතා කරන්නේ "Character" යන වචනයයි. "භූමිකා" යන වචනය හැඳින්වීමට ඉංග්‍රිසි භාෂාවෙන් "Role" යන වචනය යොදන බව දැන් අප දනිමු.

ගිහාන් යනු චරිතයකි. ඔහු වෘත්තීය වශයෙන් ඉංජිනේරුවෙකි. ඒ අනුව ඉංජිනේරුවා යනු ඔහුගේ එක් භූමිකාවකි. එසේ ම ඔහු දරුවන් සිටින විවාහකයෙකි. ඊට අමතරව පාසලේ ආදි ශිෂ්‍ය සංගමයේ සභාපතිවරයා සේම ගමේ පන්සලේ ප්‍රධාන දායකයෙකි.

ගිහාන් නම් චරිතයේ භූමිකා ලෙස,

**චරිතය - ගිහාන්**

භූමිකා :- ඉංජිනේරුවරයා

පියා/සැමියා

ආදි ශිෂ්‍ය සංගමයේ සභාපති

ගමේ පන්සලේ දායකයෙකි

ජීවිතයේ දී සියලුම පුද්ගලයන් දැන හෝ නොදැන විවිධ භූමිකා නිරූපණය කරයි. නමුත් මේ සෑම භූමිකාවක දී ම එකම චර්යා රටාවක්, හැසිරීම් රටාවක්, කතා විලාසයක්, අඳින පළඳින ආකාරයක් පවත්වා නොගනියි. මෙහි දී විවිධ භූමිකා නිරූපණයේ දී බාහිර හා අභ්‍යන්තර වශයෙන් ස්වරූප දෙකක් ඇත. එම වෙනස් වීම් සඳහා අඳින පළඳින ආකාරය ප්‍රබල බලපෑමක් සිදු කරයි.

උදාහරණයක් ලෙස ගිහාන් නිවසේ දී දරුවන්ට පියෙකු ලෙසත් බිරිඳට ආදරණීය ස්වාමියෙකු ලෙස හැසිරෙන ආකාරය එකිනෙකට වෙනස් ස්වරූපයන් ගනී. එසේම සිය සේවා ස්ථානයේ ද ඔහුගේ හැසිරීම් රටාව, කතා විලාසය, අඳින පළඳින ආකාරය නිවසේ සිටින ආකාරයට වඩා හාත්පසින් ම වෙනස් වේ.

**භූමිකා නිරූපණයේ දී වැදගත් දේ:-**

- චිත්ත ඒකාග්‍රතාවය වැදගත් වේ.
- මතක තබා ගැනීමේ ශක්තිය (ස්මරණ ශක්තිය) වැදගත් වේ.
- චරිත නිරූපණයේ දී ඒ ඒ අවස්ථාවට උචිත පරිදි විවිධ භූමිකාවලට සමාරෝපය විය යුතු යි.
- එකම චරිතය වුව ද ඒ ඒ භූමිකාවට උචිත ලෙසින් අවස්ථානුකූලව විවිධ හැසිරීම් රටා අනුගමනය කළ යුතුය.
- සමාජ අත්දැකීම් හොඳින් නිරීක්ෂණය කිරීම, චරිත පිළිබඳ ව සිදු කරන අධ්‍යයනය සාර්ථක භූමිකා නිරූපණයකට උපකාරී වේ.

## -පැවරුම-

1. ඔබ නිවසේ සිටින විවිධ චරිත (අම්මා, තාත්තා, සහෝදරයින්) සමාජයේ දී නිරූපණය කරනු ලබන විවිධ භූමිකා මොනවාද යන්න ලියා දක්වන්න.
2. ඒ ඒ භූමිකා නිරූපණයේ දී බාහිර සහ අභ්‍යන්තර ස්වරූප වෙනස් වන ආකාරය වෙන වෙන ම සටහන් කරන්න.